දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

රුහුණ විශ්වවිද්‍යාලය


ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2022 - පුනර් පරීක්ෂණය

2022 නොවැම්බර්/ දෙසැම්බර්

# පාසා 2.2 - ව්‍යාකරණය හා අනිර්දිෂ්ට ග්‍රන්ථ

පළමුවන කොටසටත් දෙවන කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න. කාලය : පැය තුනයි (03)

---

## පළමුවන කොටස

(01) සිංහලට පරිවර්තනය කරන්න.

සෙය්‍යථාපි සාරිපුත්ත පොක්ඛරණී අච්ඡෝදිකා සාතෝදිකා සීතෝදිකා සෙතකා සුපතිත්ථා රමණීයා, අවිදූරෙ චස්සා තීරෙ වනසණ්ඩො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ඝම්මාභිතත්තො ඝම්මපරෙතො කිලන්තො තසිතො පිපාසිතො ඒකායනෙන මග්ගෙන තමෙව පොක්ඛරණිං පණිධාය. තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: තථායං භවං පුරිසො පටිපන්නො තථා ච ඉරියති, තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා ඉමංයෙව පොක්ඛරණිං ආගමිස්සතීති. තමෙනං පස්සෙය්‍ය අපරෙන සමයෙන තං පොක්ඛරණිං ඔගාහෙත්වා න්හායිත්වා පිවිත්වා ච සබ්බදරථකිලමථපරිළාහං පටිපස්සම්භෙත්වා පච්චුත්තරිත්වා තස්මිං වනසණ්ඩෙ නිසින්නං වා නිපන්නං වා ඒකන්තසුඛා වෙදනා වෙදියමානං. එවමෙව ඛො අහං සාරිපුත්ත ඉධෙකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති, තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති. තමෙනං පස්සාමි අපරෙන සමයෙන ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තං ඒකන්තසුඛා වෙදනා වෙදියමානං. ඉමා ඛො සාරිපුත්ත පඤ්ච ගතියො.

(ලකුණු 20 යි)

දෙවන පිටුවට......

(02) සිංහලට පරිවර්තනය කරන්න.

ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී.

න හි ධම්මො අධම්මො ච උභො සමවිපාකිනො,
අධම්මො නිරයං නෙති ධම්මො පාපෙති සුගතිං.

තස්මා හි ධම්මෙසු කරෙය්‍ය ඡන්දං
ඉති මොදමානො සුගතෙන තාදිනා,
ධම්මෙ ඨිතා සුගතවරස්ස සාවකා
නීයන්ති ධීරා සරණවරග්ගගාමිනො.

විප්ඵාලිතො ගණ්ඩමූලො[1]
තණ්හාජාලො සමූහතො,
සො ඛීණසංසාරො න චත්ථි කිඤ්චනං
චන්දො යථා දොසිනා පුණ්ණමාසියන්ති.[2]

(ලකුණු 20 යි)

(03) පාලියට පරිවර්තනය කරන්න.

පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍ය කරන කල්හි බෝසතාණන් වහන්සේ හිමවත් පෙදෙසෙහි සිංහ යෝනියෙහි උපන් සේක. ඔහුට බාල සහෝදරයෝ හය දෙනෙක් ද එක් සහෝදරියක් ද වූහ. සියළු දෙනාම රන් ගුහාවක වාසය කරති. ඒ ගුහාවට නුදුරෙහි රිදී පර්වතයක එක් පළිඟු ගුහාවක් ඇත. එහි එක් හිවලෙක් වාසය කරයි. පසු කලෙක සිංහයන්ගේ මව්පියෝ මිය පරලොව ගියාහුය. ඒ සිංහයෝ නැගණිය වූ සිංහ පෝතිකාව රන් ගුහාවෙහි රඳවා ගොදුරු පිණිස නික්මී මස් ගෙනවුත් ඇයට දෙති. ඒ හිවලා ද සිංහ පෝතිකාව දැක පිළිබඳ සිත් ඇතිවිය. ඇගේ මව්පියන් ජීවත්ව සිටියදී ඊට ඉඩක් ලැබුණේ නැත. හිවලා සහෝදරයෝ සත් දෙනාම ගොදුරු පිණිස ගිය කල්හි පළිඟු ගුහාවෙන් බැස රන් ගුහාවේ දොරටුව ළඟට ගොස් සිංහ පෝතිකාවගේ ඉදිරියෙහි පස්කම් ගුණයෙන් යුත් මෙබඳු රහස් කථාවක් කීවේය. "සිංහ පෝතිකාවනි, මම ද සිව්පාවෙක් වෙමි. නුඹ ද සිව්පා දෙනකි. නුඹ මගේ බිරිඳ වෙව. මම නුඹේ ස්වාමියා වන්නෙමි. ඒ අපි සමගියෙන් සතුටින් වසන්නෙමු. නුඹ මෙතැන් පටන් ආදරයෙන් මට සංග්‍රහ කරව" යනුයි. ඇය හිවලාගේ වචන අසා "මේ හිවලා සිවුපාවුන් අතුරෙන් පහත් නින්දා ලැබිය යුතු සැඩොලෙකු හා සමානය. අපි උතුම් රජ කුලයට හා සමානයි. මොහු වනාහි මා සමඟ අසභ්‍ය නුසුදුසු දෙයක් කියයි. මම මෙබඳු කථාවක් අසා ජීවිතයෙන් කුමක් කරන්නෙම් ද? හුස්ම හිරකරගෙන මැරෙන්නෙමි"යි සිතුවාය.

(ලකුණු 20 යි)

තුන්වැනි පිටුවට......

දෙවන කොටස

(04) පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් කෙටියෙන් හඳුන්වා කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායට අයත් පරිවාර ග්‍රන්ථ පිළිබඳ විමසීමක් කරන්න.

(05) "භාෂා පරිණාමය නිසා භාෂාවේ විචිත්‍රත්වයක් ඇති වෙයි" පාලි භාෂාව ඇසුරෙන් මෙම කියමන සනාථ කළ හැකි දැයි විමසන්න.

(06) සත්තමී විභක්තිය හඳුන්වා සත්තමී විභක්ති යෝජනයෙහි විවිධ අර්ථ නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

(07) තද්ධිත ප්‍රභේද නම්කොට භාව තද්ධිතය හඳුන්වන්න.

(08) පඤ්චමී ආඛ්‍යාතය යෙදෙන අවස්ථා මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි.)

@@@@@@@@@@@@@@@@@@@@@@@@